# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 471/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 17/03/2024 පැය1515

**මාධ්‍ය නිවේදනය**

**ප්‍රජා පොලිස් කමිටු සාමාජිකයින් දැනුවත් කිරීමේ වැඩසටහන - ප්‍රජා පොලිස් කොට්ඨාසය.**

යාපනය හා කන්කසන්තුරය පොලිස් කොට්ඨාස වලට අයත් ප්‍රජා පොලිස් කමිටු සාමාජිකයින් දැනුවත් කිරීමේ වැඩසටහනක් 2024.03.17 වන අද දින පෙරවරු 1000 ට මහජන ආරක්ෂාව පිළිබඳ ගරු අමාත්‍ය ටිරාන් අලස් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වියානි ගුණතිලක මහතා සහ පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ සහභාගිත්වයෙන් යාපනය US හෝටල් පරිශ්‍රයේ දී පැවැත්විණි.

යාපනය හා කන්කසන්තුරය පොලිස් කොට්ඨාස වලට අයත් ග්‍රාම සේවා වසම් 431ක ප්‍රජා පොලිස් කමිටු සමාජිකයින් 2000ක පමණ පිරිසක් මෙම අවස්ථාවට සහභාගී වූ අතර කමිටු සාමාජිකයින් අමතා මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස් මහතා සහ පොලිස්පතිතුමා, ප්‍රදේශයේ අපරාධ අවම කර ගැනීම සඳහා යුක්තිය මෙහෙයුම තවදුරටත් ක්‍රියාත්මක කරන බවටත් උතුරු නැගෙනහිර පදිංචි ද්‍රවිඩ ජනතාව මූලික කරගෙන පැය 24 පුරා ක්‍රියාත්මක "107" හදිසි දුරකථන අංකය ඔස්සේ ලැබෙන පැමිණිලි හා අපරාධ පිළිබඳ තොරතුරු නිසි පරිදි පොලිස් ස්ථාන මඟින් විමර්ශනය කරන බවත් කමිටු සාමාජිකයින් හමුවේ ප්‍රකාශ කරන ලදි.

මෙම අවස්ථාව " ස්වස්ති ෆයින්" කලායතනයේ නර්ථන කණ්ඩායමක් විසින් විචිත්‍රවත් කල අතර උතුරු පලාතට පැමිණීම වෙනුවෙන්, ගරු මහජන ආරක්ෂක අමත්‍ය ටිරාන් අලස් මහතා, මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වියානි ගුණතිලක මහතා සහ පොලිස්පති තුමා වෙත උතුරු පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති මහින්ද ගුණරත්න මහතා ඇතුළු උසස් පොලිස් ප්‍රධානීන් විසින් සමරු සිහිවටන ප්‍රදානය කිරීමක් ද සිදු කෙරිණි.

මෙහිදී පැමිණ සිටි පිරිස වෙනුවෙන් සර්ව ආගමික වතාවත් ඉටු කෙරුණු අතර ශ්‍රී ලංකා පොලිසියේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක් ද සහභාගී විය.

මෙම වැඩසටහනට අදාල ඡායාරූප කිහිපයක් මේ සමග එවමි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**